# ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය.

ආණ්ඩුවේ අවසරයපිට ප්‍රසිධකරණලද්දී.

අංක 8,875—1942ක්වූ මාර්තු මස 6 වෙනි දිනවූ සිකුරාදා.

## Part IV.—හතරවෙනි කාණ්ඩය.

### ආණ්ඩුවට ඉඩම් ලබාගැනීම සම්බන්ධ දැන්වීම.

ආණ්ඩුවේ අවශ්‍යත්තාව, ඒනම්:—ඉදිපරපෙ අමුණ බැදීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැනීම සඳහා ක්‍රියා කරණ පිණිස "ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ව්‍යවස්ථාවේ" 5වෙනි වගන්තියේ කරනිබෙන සංශෝධනවල ප්‍රකාරයෙව පලාත් ආණ්ඩුකාරක ම හතුණ සභාවට උතුමාණන්වහන්සේගෙන් පැවරී තිබෙන බලය පිට නිසිආකාර මට අණ ලැබීතිබේ, ඒ ඉඩමනම්:—

සිතියමේ නො. A 1,421. ගම—සියඹලාගොඩ.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරයින්ගේ නම. | ප්‍රමාණය, අ. රූ. පැ. |
|---|---|---|---|---|
| 1 | ගල්ඇල්පැලකුඹුර .. | මෙසන්වැඩකරණලද අමුණක කොටසක්ද, කන්ඩියක කොටසක්ද, ඇලක කොටසක්ද ඇති කුඹුර | එච්. බී. ජේම්ස්සිංඤෝ, වඩුමාවල ආණ්ඩුවේ පාඨශාලාව, අරණයක | 0 0 8·8 |

එබැවින් ඉඩම අයිතිකරගැණීමට ආණ්ඩුවේ සැලසුම තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හයවෙනි වගන්තියේ ඔහුකර තිබෙන හැටියට මෙසින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සැමදෙනාම තමුන්ම හෝ හෝ තමුන් වෙනුවෙන් ක්‍රියාකරණ අය වර්ෂ 1942ක්වූ මාර්තු මස 30වෙනි දින පෙරවරු 10ට මෙම කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියා සිටින්ට ඕනෑම සහ මෙම ඉඩම වෙනුවෙන් ඉල්ලාසිටින මුදල් ගණනක් ඒව ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියා සිටින්ට ඕනෑ බව මෙසින් දැනගත යුතුයි.

වර්ෂ 1942ක්වූ මාර්තු මස 3වෙනි දින
කොළඹ කච්චේරියේදීය.

ජේ. ඇල්. ඊ. ප්‍රනාන්දු,
ආණ්ඩුවේ අතිරේක උප ඒජන්ත වමහ.

---

### සුප්‍රිම් උසාවියේ දැන්වීමයි.

ශ්‍රී ලඞකාවිපගේ ගරුකවශුතු උතුම්වූ සුප්‍රිම් උසාවියෙන් මට ලැබීතිබෙන ආඥාවක බලය කරණකොටගෙන මෙසින් ප්‍රකාශ කරන්නේනම් බස්නාහිර දිසාවේ ක්‍රිමිනෙල් නඩුවිභාගය වර්ෂ 1942ක්වූ මාර්තු මස 20වෙනි දින පෙරවරු 11 පැය පටන් කොළඹ අළුත්කඩේ තිබෙන නඩුසාලාවේ පවත්වන්ට යෙදෙනවා ඇත. එහි යම් කාරණ ඇතුව සිටින සැමදෙනාම යටකී ගිනයට යටකී වෙලාවට ඇවිත් පෙණීසිටින්ට ඕනෑවත් ඇර අවසර ඉල්ලා ලබාගෙන මිස එසින් පිටකට යන්ට නුසුඵවන බවත් මෙසින් සැමදෙනාටම දන්වන්නෙමි.

එච්. සී. විජේසිංහ,
බ. ප. පිස්කල් වමහ.

වර්ෂ 1942ක්වූ පෙබරවාරි මස 25වෙනි දින
කොළඹ පිස්කල් කන්තෝරුවේදීය.

### අන්‍ය දැන්වීමයි.

කළුතර දිස්ත්‍රික්කේ රයිගම්කෝරළේ අදිකාරිපත්තුවේ බණ්ඩාරගම පදිංචි විල්සන් මහම්පේරි වන මම කළුතර දිස්ත්‍රික්කයේ සිංහල භාෂාවෙන් වැඩකරන ප්‍රසිඛ නොතාරිස් කෙනෙකු මෙන් පත්කරන පිණිස මෙවක් පටන් තුන්මාසයක් ගතවූපසු රෙජිස්ට්‍රාර් ජනරල්තුමාගෙන් ඉල්ලීමට අදහස්කර සිටින බව වර්ෂ 1907යේ අංක 1 දරණ ආඥාපණතේ 1 වී දරණ උප ලෙඛණයේ 2වෙනි නියෝගයේ ප්‍රකාර මෙසින් දන්වමි.

බණ්ඩාරගම,
20 පෙබරවාරි, 1942.

ඩබ්ලිව්. මහම්පේරි.

---

PRINTED AT THE CEYLON GOVERNMENT PRESS, COLOMBO.

29——J. N. A 11544—44 (2/42)